G1

සියලුම අයදුම්කරුවන් වෙත,

<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල් වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2026</u>

දිවයිනේ ජාතික හා පළාත් පාසල් වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රජයේ සේවයේ නියුතු උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව පළ කරන ලද අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් හා රජයේ සේවයේ නියුතු නොවන සෙසු උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව පළ කරන ලද අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධිත අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය ප්‍රකාරව අයදුම් කරන ලද අයදුම්කරුවන් සඳහා ලිඛිත තරඟ විභාගයන් 2026.05.24 දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලදී..

02. එම තරඟ විභාගයන්ට ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතුරින් එක් එක් ගැසට් නිවේදන අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලද අයදුම්කරුවන්ගේ නාම ලේඛනයන් අදාළ අයදුම්කරුවන් විභාගයට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය අනුව, ඉල්ලුම් කරන ලද පාසල් ගණයන් (ජාතික,ජාතික/පළාත්,පළාත්) අනුව හා අයදුම්පත්‍රයේ දක්වන ලද තමන්ගේ ස්ථිර පදිංචි පළාතට අදාළව පහත පරිදි අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවියේ මෙන්ම එක් එක් පළාත්හි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා හෝ එකී කොමිෂන් සභාවල නිර්දේශ මත පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ/පළාත් ප්‍රධාන අමාත්‍යාංශ වෙබ් අඩවි ඔස්සේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

අනු අංකය	**පළාත**	**අදාල ගැසට් නිවේදනය**	**ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය**
1.	බස්නාහිර පළාත	**A1**- 2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B1(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
2.	මධ්‍යම පළාත	**A2**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B2(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B2(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
3.	දකුණු පළාත	**A3**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B3(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි

		B3(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
4.	උතුරු පළාත	**A4**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B4(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B4(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
5.	නැගෙනහිර පළාත	**A5**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B5(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B5(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
6.	වයඹ පළාත	**A6**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B6(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
7.	උතුරුමැද පළාත	**A7**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B7(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B7(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
8.	ඌව පළාත	**A8**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B8(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B8(ii)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති ගැසට් නිවේදනය පූර්ණකාලීන ආබාධිත වූවන් හට වෙන් වන පුරප්පාඩු	සිංහල / දෙමළ / ඉංග්‍රීසි
9.	සබරගමු පළාත	**A9**-2474/18 හා 2026.02.02 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි
		B9(i)-2474/19 හා 2026.02.02 දිනැති, සහ 2476/18 හා 2026.02.18 දිනැති	සිංහල
			දෙමළ
			ඉංග්‍රීසි

සටහන : ලිඛිත විභාගයේ ලකුණු මත මධ්‍යම, දකුණු, උතුරු, නැගෙනහිර, උතුරුමැද හා ඌව යන පළාත්වල පදිංචි පූර්ණකාලීන ආබාධිත වූ අය පමණක් පූර්ණකාලීන ආබාධිත වූවන්ට වෙන්වූ පුරප්පාඩු විෂයයන් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ට සුදුසුකම් ලැබීම මත එකී පළාත් සඳහා පමණක් B(ii) පුරප්පාඩු ලේඛන ප්‍රදර්ශනය කර ඇත.

03. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම පත්වීම් ලැබීමට සුදුසුකමක් ලෙස නොසැලකෙන අතර, මෙම අදියරේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් කවුරුන්ද යන්න, අයදුම්කරු හට සිය ජාතික හැඳුනුම්පත් අංකය හෝ විභාග අංකය ඇතුළත් කිරීම මඟින් පරීක්ෂා කිරීමට හැකිය. (අයදුම්කරු මෙම විභාගයට පූර්ණකාලීන ආබාධිත වූ අයෙකු ලෙස අයදුම් කර ඇත්නම් හා අදාළ පළාත යටතේ පූර්ණකාලීන ආබාධිත වූවන් සඳහා වෙන් කරන ලද B(ii) ලේඛන පුරප්පාඩු මෙන්ම අනෙකුත් B(i) ලේඛන පුරප්පාඩු සඳහාද තමන් ලද ලකුණු මත තේරී පත්ව ඇති අවස්ථා පැවතීමට හැකි බැවින් එවැනි අයදුම්කරුවන් සිය පළාතට අදාල B ලේඛන දෙකම පරීක්ෂා කර සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලද විෂයන් තහවුරු කරගත යුතුය)

04. මෙම බඳවා ගැනීමට අදාළ, සම්මුඛ පරීක්ෂණයන් සඳහා සුදුසුකම් ලැබූවන් හට සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය, වේලාව, ස්ථානයන් හා සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛන ද එක් එක් අයදුම්කරු විසින් ලිඛිත විභාගය සඳහා අයදුම් කරන අවස්ථාවේ සඳහන් කර ඇති ලිපිනයන් වෙත ඉදිරියේදී ලිඛිතව දැන්වීමට කටයුතු කරනු ලැබේ. එසේම එකී සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට අදාළ දිනය, වේලාව හා ස්ථාන දක්වන ලද ලේඛනයද උක්ත පරිදි 2026.10.15 දින සිට 2026.10.30 දින අතර කාලය තුළ මෙම අමාත්‍යාංශයේ හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා හෝ එකී කොමිෂන් සභා වල නිර්දේශ මත පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ/පළාත් ප්‍රධාන අමාත්‍යාංශ වෙබ් අඩවි ඔස්සේද ප්‍රදර්ශනය කරනු ලැබේ.

05. තවද, උක්ත සඳහන් ගැසට් නිවේදනයන්හි සටහන 4 හෝ 6 ප්‍රකාරව ඔබ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලද විෂයන්ට අදාළව උපාධි සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීම සඳහා මේ සමඟ දක්වා ඇති G2 උපදෙස් භාවිතා කර සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේදී උපාධියට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය